Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පාඩම/ඒකකය - 7.2.2. මැදවල ටැම්පිට විහාරය**

1. ඉගෙනුම් අත්වැල

- ගල් කණු මත ඉදිකළ විහාරයක් වන හෙයින් ටැම්පිට විහාරයක් ලෙස හඳුන්වන මැදවල විහාරය මහනුවරට නුදුරු මැදවල ග්‍රාමයේ පිහිටා ඇත.
- මැදවල ටැම්පිට විහාරය අඩි 01 යි අඟල් 08ක් උස් වූ ගල් කණු 34ක් මත ඉදිකර ඇත.
- මැද මහනුවර සම්ප්‍රදායට අයත් ඉතා සියුම් හා විශිෂ්ට නිමාවන්ගෙන් යුතු චිත්‍ර නිර්මාණ මෙම විහාරයේ දැකිය හැකි ය.
- මැදවල විහාරය තුළ දක්නට ලැබෙන කුඩා තීරු සංරචන සිතුවම් අතර ජාතක කතා, සත් සතිය වැනි මාතෘකා විශේෂ වේ. ජාතක කතා අතර වෙස්සන්තර ජාතකය හා උරග ජාතකය ප්‍රධාන තැනක් ගනියි.
- සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ

  - පාර්ශ්ව දර්ශී රූප හා තිරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය

  - ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය හා වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය

  - ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය

  - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය

  - පසුබිම සඳහා ගුරු වර්ණය හා පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය



මැදවල ටැම්පිට විහාරය

වෙස්සන්තර ජාතකය



2. ඇගයීම

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) ටැම්පිට විහාරයක ඇති මූලික ලක්ෂණ මොනවාද?

02) මැදවල විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා ලක්ෂණ විස්තර කරන්න.

03) මැදවල විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

- යුගය/ කාලය
- අනුග්‍රහය
- ශිල්පියා

04) මැදවල විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් පිළිබඳ පහත කරුණු යටතේ කලාත්මක ඇගයීමක් කරන්න.

- වස්තු විෂය
- ශෛලිය
- ශිල්ප ක්‍රමය
- වර්ණ භාවිතය
- රේඛාකරණය
- භාව ප්‍රකාශන